වාර්ෂික කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2019

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

බී කොටස, 3 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල.

நன்னடத்தை, சிறுவர் பராமரிப்புச் சேவைகள் திணைக்களம்

பீ பிரிவு, 3 ஆம் மாடி, செத்சிறிபாய கட்டம் II, பத்தரமுல்லை.

Department of Probation and Child Care Services

Section B, 3rd Floor, Stage II, Sethsiripaya, Battaramulla

2019 වර්ෂය සඳහා
වාර්ෂික කාර්යය සාධන වාර්තාව
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය : 217

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බී කොටස, 3 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල.

පෙළගැස්ම

01. ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 6

1.1 හැඳින්වීම 7

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු........ 8

1.3 ප්‍රධාන කාර්යයන්........ 9

1.4 සංවිධාන සටහන 10

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ........ 11

1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 11

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම 12

03. 2019දෙසැම්බර්31දිනෙන්අවසන්වූවසරසඳහාවනසමස්තමූල්‍යකාර්ය සාධනය 22

3.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය 23

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 25

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 26

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 27

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යය සාධනය 28

3.6 මු.රෙ.208 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන........ 29

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 31

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව 32

04. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 39

05.තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය 40

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු........ 41

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග........ 44

06. මානව සම්පත් පැතිකඩ 46

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය........ 47

6.2 ආයතනයේ කාර්යය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපානු ලැබ ඇති ආකාරය 47

6.3 මානව සම්පත් සංවර්ධනය 47

6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය........ 50

07. අනුකූලතා වාර්තාව 52

01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

වර්ෂ එක්දහස් නවසිය තිස් ගණන්වලදී ශ්‍රී ලංකාවේ අධිකරණය විසින් පරිවාස ක්‍රමය අත්හදා බැලීමක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබීය. 1907 දී එංගලන්තයේ සම්මත කරන ලද වරදකරුවන් පිළිබඳ පරිවාස ආඥා පනත ලංකා අධිකරණය කෙරේ ද බලපෑවේය. වර්ෂ 1944 දී සම්මත කරන ලද අංක 22 දරණ පරිවාස ආඥා පනත ඉහත සඳහන් කළ බලපෑම් වල ප්‍රතිඵලයක් විය. මෙම ආඥා පනත තුළින් පරිවාස ක්‍රමය ලංකා අධිකරණයේ ස්ථාපිත විය.එංගලන්තයේ පරිවාස සේවාව ඇසුරින් ලංකාවේ ද පරිවාස සේවාවන් ආරම්භ කිරිමේ කාර්යභාරය එංගලන්තයේ උපදේශකයෙකු වන එච්.ඒ.ලීඩීන් මහතාට පැවරුණු අතර, ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පරිවාස සේවාව පරිවාස නිලධාරින් කීපදෙනෙකුගෙන් ආරම්භ විය. අත්හදා බැලීමක් ලෙස දිවයිනේ අධිකරණ කොට්ඨාශ කීපයක පමණක් ක්‍රියාත්මක කිරිමෙන් පසු මෙම සේවය අධිකරණය විසින් පිළිගනු ලැබීය. ඉන්පසු එය වැඩිදියුණු කිරිමේ අවශ්‍යතාවය ද ඉස්මතු විය.

1949 දී විනිශ්චයකාර ග්‍රේෂියන් මහතාගේ ප්‍රධානත්වයෙන් පත්කරන ලද කමිටුවේ නිර්දේශ රජය විසින් පිළිගනු ලැබීමත් සමඟ දිවයින පුරා සියළුම අධිකරණ කලාප ආවරණය වන පරිද්දෙන් පරිවාස සේවය ව්‍යාප්ත කෙරිණ. මෙම සේවාවේ පරිපාලන කටයුතු කරන ලද්දේ බන්ධනාගාර හා පරිවාස දෙපාර්තමේන්තුව විසිනි.

ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත ක්‍රියාත්මක කිරිම හා ළමා උසාවි ආරම්භ කිරිමත් සමඟම ළමයින් සඳහා සැපයෙන සේවාවන් එක්තැන් කිරිමේ වැදගත්කම පිළිබඳව සිරිල් හැම්ලින් මහතාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. එම නිර්දේශය අනුව 1956 ඔක්තෝම්බර් 01 දින පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ විය.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ වීමෙන් පසු, රැඳවුම් නිවාස, සහතික කළ පාසල්, පරිවාස කාර්යාල ඇතුළු අනෙකුත් ආයතන වල කටයුතු පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ව්‍යාප්ත වූ අතර මුළු දිවයිනම ආවරණය වන පරිදි සහකාර කොමසාරිස්වරුන් ද පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ට සහායවීම සඳහා පත් කෙරිණි.

1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ක්‍රියාත්මක වීමත් සමඟ එම ව්‍යුහය වෙනස් වූ අතර පරිවාස හා ළමාරක්ෂක සේවය පළාත් සභාවලට විමධ්‍යගත කරන ලදි. ඒ සමඟම මෙතෙක් කොමසාරිස්ට සහාය වීම සඳහා පත්කර සිටි සහකාර කොමසාරිස් තනතුරු ද අහෝසි විය.පළාත් සභා යටතේ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන් සියළු පළාත් වෙනුවෙන් පත් වූ අතර පරිවාස කාර්යාල ඔවුන්ගේ අධීක්ෂණයට යටත් විය.

1991 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයට අත්සන් තැබූ අතර 1992 වර්ෂයේ දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කරන ලදී. එම ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි වූ ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරිමේ අවශ්‍යතාවය වෙනුවෙන් 1999 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් ලෙස සිය ක්ෂේත්‍ර රාජකාරී ඉටුකර ගැනීම අරමුණු කර ගනිමින් නව තනතුරක් නිර්මාණය කර ඊට නිලධාරීන් බඳවා ගන්නා ලදී. මේ වන විට මෙම නිලධාරීන් දිවයින පුරාම පිහිටි දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්

කාර්යාල වලට අනුයුක්තව කටයුතු කරනු ලබයි. මෙමගින් පරිවාස විෂයය මෙන්ම ළමාරක්ෂක විෂයයට ද මූලිකත්වය ලබාදී වැඩසටහන් දියත් කෙරේ.

1956 දී ආරම්භ වූ දෙපාර්තමේන්තුව මුලින්ම සමාජ සේවා අමාත්‍යාංශය යටතට පත්විය. පසුව පත් වූ රජයන් විසින් වරින් වර විවිධ අමාත්‍යාංශ යටතට පත් කරන ලදී. 1990 වසර ආරම්භයේ දී එය ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 1994 අගෝස්තු මාසයෙන් පසුව සෞඛ්‍ය මහා මාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ද, 2001 වර්ෂයේ දි සමාජ සේවා හා ධීවර ප්‍රජාවගේ නිවාස සංවර්ධන අමාත්‍යාංශය යටතේ ද, 2002 දී සෞඛ්‍ය පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2003 දී සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2004 වර්ෂයේ දී කාන්තා අභිවෘද්ධි හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2005 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය යටතේ ද කටයුතු සිදු කෙරිණි. 2010 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ද, 2015 වර්ෂයේ සිට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ද, 2018 වර්ෂයේ සිට මේ දක්වා කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය යටතේද දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු කෙරේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ළමුන්ගේ අයිතීන් තහවුරු වූ ඔවුනට සංවේදී හිතකර සමාජයක්

මෙහෙවර

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ ළමයින් ද, සුවිශේෂී කර ගනිමින් සියළුම ළමයින්ගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ඔවුනට සමාන අවස්ථාවන් උදා කරදීම.

අරමුණු

- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනය
- අනාථ, අත්හල හා අසරණ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ක්‍රියා මාර්ග ගැනීම
- නීතිමය ගැටලු වලට ලක් වූ ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
- ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ තහවුරු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම
- අදාල අමාත්‍යාංශ හා පළාත් සභා සම්බන්ධීකරණය කරමින් ඔවුන්ගේ නිර්දේශ මත ළමා අයිතිවාසිකම් සම්බන්ධව දැනට පවතින අණ පනත් ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම
- පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු වලට අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණික දැනුම හා නීති උපදෙස් ලබා දීම
- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනයට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම
- පවතින අභ්‍යන්තර වත්කම් කළමනාකරණ ක්‍රමයන් වැඩිදියුණු කිරීම
- ජනතා අවශ්‍යතා තෘප්තිමත් වන ආකාරයෙන් කාර්යක්ෂම සේවාවක් සැපයීම

1.3 ප්‍රධාන කාර්යයන්

- පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය
- විදේශීය හදාවඩා ගැනීම්
- ළමුන් ගේ අධ්‍යාපන අයිතීන් තහවුරු කිරීම සඳහා වූ වැඩසටහන්
    - සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය මඟින් අසරණ ළමයින්ට අවශ්‍ය සහන සැලසීම
    - නැණ දිරිය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සහන ක්‍රියාත්මක කිරීම
    - කැපකරු දෙගුරු ආධාර ක්‍රමය මඟින් ළමයින්ට අධ්‍යාපන ආධාර ලබා දීම
- ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම වෙනුවෙන් සමාජ ව්‍යුහයන් ස්ථාපිත කිරීම හා බල ගැන්වීම
- ළමුන්ගේ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීම උදෙසා ළමා සමාජ හා ළමා සභා වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- පුහුණු හා පර්යේෂණ කටයුතු
- උපදේශනය අවශ්‍ය, නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් වෙනුවෙන් පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය පවත්වාගෙන යාම

1.4 සංවිධාන සටහන



*ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම්ට අනුයුක්ත නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් මගින් නියෝජ්‍ය සහකාර කොමසාරිස් (සංවර්ධන) වෙත වාර්තා කරනු ලැබේ.

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

ශ්‍රී.ලං.ප.සේවයට අයත් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙක්, දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරයකු, ගණකාධිකාරීවරයෙකු, නීති නිළධාරියකු, පරිපාලන නිලධාරී වරයෙකු, ජොෂ්ඨ පරිවාස නිලධාරියෙකු , පරිවාස නිලධාරියෙකු, සහ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් දෙසිය තිස්දෙදෙනෙකු ගෙන් සමන්විත මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරී මණ්ඩලයකගේ සහාය ඇතිව කොමසාරිස් විසින් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීමේ වගකීම දරනු ලැබේ.

සංවිධාන ව්‍යුහයට අයත් වන අංශ :-

1. ආයතන හා පරිපාලන අංශය
2. ගිණුම් අංශය
3. පරිවාස අංශය
4. සංවර්ධන අංශය
5. පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය

1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

(අ) ව්‍යාපෘතියේ නම : ළමුන්ගේ ආරක්ෂාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම

(ආ) දායක නියෝජිතායතනය : සේව් ද චිල්රන් ආයතනය

(ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු.මි 7.65 (2019 වර්ෂය සඳහා)

(ඈ) ව්‍යාපෘති කාල සීමාව : අවුරුදු 3

02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය (ප්‍රාග්ධන ව්‍යාපෘති) - 2019

වැය ශීර්ෂය (A)	ව්‍යාපෘතියේ නම (B)	භෞතික කටයුතු ආරම්භ කළ දිනය	අපේක්ෂිත වැඩ නිම කිරීමේ දිනය	ව්‍යාපෘති නිමැවුම්	ප්‍රධාන කාර්ය සාධන දර්ශක	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය	භෞතික ප්‍රගතිය (%)
217 -2 -2 - 3 - 2202	ළමා නිවාස ප්‍රතිසංස්කරණය	01.01.2019	31. 12. 2019	ළමා නිවාස 10	ප්‍රතිසංස්කරණය කරන ලද ළමා නිවාස ගණන	3.500	3.489	99.7	නිවාස 10	නිවාස 10	100
217 - 2 - 2- 4 - 2202	ළමා නිවාස අධීක්ෂණය	01.01.2019	31. 12. 2019	ළමා නිවාස 7	අධීක්ෂණය කල ළමා නිවාස ගණන	0.700	0.543	77.6	නිවාස 7	නිවාස 3 , රැස්වීම 6	100
	ආයතනගත දරුවන් රැකබලා ගන්නන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.	01.01.2019	31. 12. 2019	පුහුණු වැඩසටහන් 3 සහ පුහුණුකරන ලද දරුවන් රැකබලාගන්නන් සංඛ්‍යාව	පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන	2.800	2.798	99.9	පුහුණු වැඩසටහන් 3	පුහුණු වැඩසටහන් 3	100
	හඳුනාගත් දරුවන් සමාජගත කිරීම.	01.01.2019	31. 12. 2019	දරුවන් 20	පවුල සංස්ථාව සමග එක් කල දරුවන් ගණන	1.000	1.000	100.0	දරුවන් 20	දරුවන් 20	100
උප එකතුව රු.මි.						**8.000**	**7.830**	**97.8**			

වැය ශීර්ෂය (A)	ව්‍යාපෘතියේ නම (B)	භෞතික කටයුතු ආරම්භ කළ දිනය	අපේක්ෂිත වැඩ නිම කිරීමේ දිනය	ව්‍යාපෘති නිමැවුම්	ප්‍රධාන කාර්ය සාධන දර්ශක	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය	භෞතික ප්‍රගතිය (%)
	ආරක්ෂණ සැලසුම් සකස් කිරීම	01.01.2019	31.12.2019	ආරක්ෂණ සැලසුම් 232	සකස් කල ආරක්ෂණ සැලසුම් ගණන	8.696	8.642	99.4	ආරක්ෂණ සැලසුම් 232	ආරක්ෂණ සැලසුම් 231	99.56
	සකස් කල ආරක්ෂණ සැලසුම් අධීක්ෂණය සහ ඇගයීම	01.01.2019	31.12.2019	පසුවිපරම් රැස්වීම් පැවැත්වීම	පැවැත් වූ රැස්වීම් ගණන	0.300	0.090	30.1	රැස්වීම් 3	රැස්වීම් 3	100
	නාගරික ප්‍රදේශ යන්හි නැවත පදිංචි කරවන පවුල්වල ළමුන්ගේ ආරක්ෂාව සහතික කිරීම.	01.04.2019	31.08.2019	වැඩසටහන් 22	පැවැත් වූ වැඩසටහන් ගණන	0.600	0.600	100.0	වැඩසටහන් 22	වැඩසටහන් 22	100
217 - 2 - 2- 5 -2202	**ළමා අයිතිවාසිකම් සම්මුතියෙහි 30 වන වසර හා ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ (ළ.හි.ප්‍ර.නි.) 20 වසර සැමරීමේ වැඩසටහන්**										
	. 1 වන සතිය-ළමා **අයිතිවාසිකම් සම්මුතිය පිලිබඳ දැනුවත් කිරීමේ** වැඩසටහන (**ප්‍රශ්න විචාරාත්මක** වැඩසටහන)	01.05.2019	31.12.2019	වැඩසටහන් 356	පැවැත් වූ වැඩසටහන් ගණන	2.108	2.108	100.0	වැඩසටහන් 356	වැඩසටහන් 356	100
	2 වන සතිය-ග්‍රාමීය ළමා කමිටු ශක්තිමත් කිරීම	01.05.2019	31.12.2019	වැඩසටහන් 331 පැවැත්වීම	පැවැත් වූ කමිටු ගණන	2.000	1.884	94.2	වැඩසටහන් 331	වැඩසටහන් 319	96
	iii. 3 වන සතිය-ළමා හිතකාමී ආදර්ශ ගම්මාන	01.05.2019	30.08.2019	වැඩසටහන් 388 පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	1.182	1.178	99.6	වැඩසටහන් 388	වැඩසටහන් 378	97

	ශක්තිමත් කිරීම හා වර්ධනය කිරීම										
	iv. 4 වන සතිය-රජයේ නිලධාරීන් දැනුවත් කිරීමේ සති වැඩසටහන (දිස්ත්‍රික්ක)	01.05.2019	30.08.2019	වැඩසටහන්25 පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	0.365	0.365	100.0	වැඩසටහන් 25	වැඩසටහන් 25	100
	v. 4 වන සතිය-ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන (ප්‍රජා මූලික)	01.05.2019	30.08.2019	වැඩසටහන් 378 පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	1.182	1.174	99.3	වැඩසටහන් 25	වැඩසටහන් 25	100
	ළමුන්ගේ ජීවිතාරක්ෂක ප්‍රථමාධාර හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන	01.05.2019	31.07.2019	වැඩසටහන් පැවැත්වීම 331	පැවැත් වූ වැඩසටහන් ගණන	1.986	1.950	98.2	වැඩසටහන් 331	වැඩසටහන් 325	98
	වීදි දරුවන් සඳහා සුබසාධන වැඩසටහන්	01.04.2019	31.07.2019	වැඩසටහන් 6 පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	0.400	0.400	100.0	වැඩසටහන් 6	වැඩසටහන් 6	100
	දැනුවත් කිරීම සඳහා වන පත්‍රිකා සකස් කර මුද්‍රණය හා බෙදා හැරීම.	01.05.2019	31.12.2019	පත්‍රිකා 450ක් සකස් කර මුද්‍රණය හා බෙදා හැරීම	පත්‍රිකා ගණන	0.600	0.252	42.0	පත්‍රිකා 450	පත්‍රිකා 450	100
	වතු ආශ්‍රිත ළමුන්ගේ අයිතිවාසිකම් වැඩි දියුණු කිරීම	01.01.2019	30.04.2019	වැඩසටහන් 39 පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	0.600	0.599	99.8	වැඩසටහන් 39	වැඩසටහන් 39	100
එකතුව (රු.) මි						**20.019**	**19.241**	**96.1**			

වැය ශීර්ෂය (A)	ව්‍යාපෘතියේ නම (B)	භෞතික කටයුතු ආරම්භ කළ දිනය	අපේක්ෂිත වැඩ නිම කිරීමේ දිනය	ව්‍යාපෘති නිමැවුම්	ප්‍රධාන කාර්ය සාධන දර්ශකය	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය	භෞතික ප්‍රගතිය (%)
217 - 2 - 2- 5 -2202	ළමා අයිතිවාසිකම් පිළිබඳ ස්ටිකර් මගින් දැනුවත් කිරීමේ වැඩසටහන -	01.01.2019	31.03.2019	වැඩසටහන් 331 පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	0.993	0.989	99.6	වැඩසටහන් 331	වැඩසටහන් 331	100
	ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම (ජාතික)	01.01.2019	31.12.2019	රැස්වීම්3 ක් පැවැත්වීම	පැවැත් වූ රැස්වීම් ගණන	0.180	0.077	42.8	රැස්වීම්3	රැස්වීම් හා සාකච්ඡා 3	100
	ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම (පළාත්)	01.01.2019	31.12.2019	රැස්වීම් 9 ක් පැවැත්වීම	පැවැත් වූ රැස්වීම් ගණන	0.612	0.341	55.7	රැස්වීම් 9	රැස්වීම් 9	100
	ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම (දිස්ත්‍රික්)	01.01.2019	31.12.2019	රැස්වීම් 300 ක් පැවැත්වීම	පැවැත් වූ රැස්වීම් ගණන	1.170	1.152	98.5	රැස්වීම් 300	රැස්වීම් 285	95
	ලෝක ළමා දිනය (දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා විශේෂ)	01.05.2019	31.10.2019	වැඩසටහන් 356 ක් පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	1.930	1.918	99.4	වැඩසටහන් 356	වැඩසටහන් 356	100
	වාර්ෂික සම්මේලනය පැවැත්වීම	01.04.2019	31.05.2019	වාර්ෂික සම්මේලනය පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	1.200	0.396	33.0	වැඩසටහන් 1	වැඩසටහන් 1	100
	ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	01.05.2019	30.11.2019	වැඩසටහන් 12ක් පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	0.500	0.450	90.0	වැඩසටහන් 12	වැඩසටහන් 12	100

	තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව දැනුවත් කිරීම (නිලධාරීන් සහ දරුවන්)	01.05.2019	31.12.2019	වැඩසටහන් 2ක් පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	0.540	0.540	100.0	වැඩසටහන් 2	වැඩසටහන් 2	100
	ආයතනගත දරුවන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම	01.01.2019	31. 12. 2019	වැඩසටහන් 2ක් පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	0.400	0.300	75.0	වැඩසටහන් 2	වැඩසටහන් 2	100
	දරුවන් ගේ ජීවන නිපුණතා ඔප් නැංවීම (පලාත් + පරත්ත)	01.01.2019	31. 12. 2019	වැඩසටහන් 4 ක් පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	2.500	1.686	67.4	වැඩසටහන් 4	වැඩසටහන් 4	100
	විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය	01.01.2019	31. 12. 2019	විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය මුද්‍රණය	විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය	0.190	0.190	100.0	විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය	මුද්‍රිත විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය (පොත් 2000)	100
	දරුවන් සඳහා විශේෂ වැඩසටහන් පැවැත්වීම	01.01.2019	30.06.2019	වැඩසටහන් 23 ක් පැවැත්වීම	පැවැත් වූ වැඩසටහන් ගණන	1.500	1.049	69.9	වැඩසටහන් 23	වැඩසටහන් 23	100
උප එකතුව රු.මි.						**11.715**	**9.0877**	**77.6**			

වැය ශීර්ෂය (A)	ව්‍යාපෘතියේ නම (B)	භෞතික කටයුතු ආරම්භ කළ දිනය	අපේක්ෂිත වැඩ නිම කිරීමේ දිනය	ව්‍යාපෘති නිමැවුම්	ප්‍රධාන කාර්ය සාධන දර්ශකය	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය	භෞතික ප්‍රගතිය (%)
217 - 02-02- 06-2202	පාසැල් නොයන දරුවන් පාසාල් ගත කිරීම	01.01.2019	30.04.2019	ප්‍රතිලාභී දරුවන් 1971	ප්‍රතිලාභී දරුවන් ගණන	1.971	1.971	100.0	දරුවන් 1971	දරුවන් 1971	100
	සෙනෙහස ආධාර (සුනාමියෙන් හා ගංවතුරින් විපතට පත් දරුවන් සඳහා)	01.01.2019	31.12.2019	ප්‍රතිලාභී දරුවන් 56	ප්‍රතිලාභී දරුවන් ගණන	1.100	1.100	100.0	දරුවන් 56	දරුවන් 56	100
	වෛද්‍ය ආධාර	01.04.2019	31. 12. 2019	ප්‍රතිලාභී දරුවන් 479	ප්‍රතිලාභී දරුවන් ගණන	2.600	2.600	100.0	දරුවන් 479	දරුවන් 479	100
	නිවුන් දරු ආධාර	01.04.2019	31. 12. 2019	ප්‍රතිලාභී නිවුන් දරුවන් 640 (පවුල් 320)	ප්‍රතිලාභී දරුවන් ගණන	2.400	2.400	100.0	නිවුන් දරුවන් 320	නිවුන් දරුවන් 320	100
	හදිසි විපත් ආධාර	01.04.2019	31. 12. 2019	ප්‍රතිලාභී දරුවන් 159	ප්‍රතිලාභී දරුවන් ගණන	0.737	0.737	100.0	දරුවන් 159	දරුවන් 159	100
	කැපකරු දෙගුරු ශිෂ්‍යාධාර වැඩසටහන	01.01.2019	31.12.2019	ප්‍රතිලාභී දරුවන් 1996	ප්‍රතිලාභී දරුවන් ගණන	12.000	12.000	100.0	දරුවන් 1996	දරුවන් 2100	100

	ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව පැවැත්වීම	01.05.2019	31.12.2019	ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය සම්බන්ධ ජාතික කමිටුව පැවැත්වීම	පැවැත් වූ කමිටු ගණන	0.020	0.020	97.5	රැස්වීම් 1	රැස්වීම් 1	100
	ළමා අයිතිවාසිකම් පිළිබඳ පළාත් මෙහෙයුම් කමිටු	01.05.2019	31.12.2019	කමිටු 6 ක් පැවැත්වීම	පැවැත් වූ කමිටු ගණන	0.050	0.050	100.0	කමිටු 6	කමිටු 6	100
	ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම	01.01.2019	31.12.2019	කමිටු 1304 ක් පැවැත්වීම	පැවැත් වූ කමිටු ගණන	3.260	3.019	92.6	කමිටු 1304	කමිටු 1213	93
	ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු සවිබල ගැන්වීම	01.01.2019	30.04.2019	කමිටු 326 ක් පැවැත්වීම	පැවැත් වූ කමිටු ගණන	0.662	0.653	98.6	කමිටු 326	කමිටු 326	100
	මිනිස් ජාවාරම පිළිබඳ පරිවාස නිලධාරීන් හා කම්කරු නිලධාරීන් දැනුවත් කිරීම	01.05.2019	31.12.2019	පුහුණු වැඩසටහන් පැවැත්වීම	පැවැත් වූ පුහුණු වැඩසටහන් ගණන	0.050	0.000	0.0	පුහුණු වැඩසටහන් 0	පුහුණු වැඩසටහන් 0	0
උප එකතුව රු.මි.						**24.850**	**24.550**	**98.8**			
මුළු එකතුව රු.						**64.584**	**60.708**	**93.4**			

වැය ශීර්ෂය (A)	ව්‍යාපෘතියේ නම (B)	භෞතික කටයුතු ආරම්භ කළ දිනය	අපේක්ෂිත වැඩ නිම කිරීමේ දිනය	ව්‍යාපෘති නිමැවුම්	ප්‍රධාන කාර්ය සාධන දර්ශකය	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය	භෞතික ප්‍රගතිය (%)
120-02-04-24-2509-13	ළමා රැකවරණ මධ්‍යස්ථානයන්හි සිටින ළමුන් පිළිබඳ සමීක්ෂණය	01.05.2019	31.12.2019	සංගණනය	සංගණනය	5.000	1.0323	20.60	සංගණනය	සංගණනය	60
උප එකතුව රු.මි.						**5.000**	**1.0323**				

විශේෂ ජයග්‍රහණ

- විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සඳහා කැබිනට් අනුමැතිය ලැබීම
- ජිනීවාහීදී පැවති එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජය විසින් එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද 5 සහ 6 වාර්තාව පිළිබඳ කමිටුවේ ප්‍රශංසාව හිමිවිය
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පවත්වන ලද ඇගයීම් වැඩසටහනනේ දී අප දෙපාර්තමේන්තුව අත් කරගත් විශිෂ්ඨ කාර්ය සාධනය වෙනුවෙන් රන් සම්මානය ප්‍රදානය කරන ලදී

03

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

සඳහා වන

සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	සතය 2019	2,018	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළදාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		73,610,000	77,939,000	ඒසීඒ-3
-	තැන්පතු		1,257,906	1,072,939	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		12,471,285	11,453,220	ඒසීඒ-5/5(ඒ)/5 (බී)
-	වෙනත් ලැබීම්		3,373,309	4,605,474	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**90,712,500**	95,070,633	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**90,712,500**	95,070,633	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
248,127,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	252,981,861	225,839,176	ඒසීඒ-2(ii)
38,983,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	36,597,164	35,293,296	ඒසීඒ-2(ii)
7,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	5,563,306	5,837,660	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
294,110,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**295,142,331**	266,970,132	

	මූලධන වියදම්				
300,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	271,193	452,507	
3,686,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	2,643,823	1,559,889	**ඒසීඒ-2(ii)**
73,514,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	60,707,991	72,046,892	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,900,000.00	හැකියා වර්ධනය	**14**	1,298,468	1,697,800	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
79,400,000.00	**මුළු මූලධන වියදම් (ඉ)**		**64,921,475**	75,757,088	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**11,057,807**	**10,044,071**	
	තැන්පතු ගෙවීම්		1,198,316	1,038,468	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		9,859,491	9,005,603	**ඒසීඒ-5/5(ඒ)/5(බී)**
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		371,121,613	352,771,291	
-	**2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		**(280,409,113)**	**(257,700,658)**	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2019 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තතය 2019 රු.	2018 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	75,112,945	64,605,215
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	42,556,568	45,168,361
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	652
මුළු වත්කම්		**117,669,513**	**109,774,228**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		42,451,722	45,123,126
දේපළ පිරියත හා උපකරණ සංචිතය		75,112,945	64,605,215
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	104,846	45,235
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	652
මුළු වගකීම්		**117,669,513**	**109,774,228**

පිටු අංක 7 සිට 63 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 64 සිට 81 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : ඒ.එස්.එම්.එස්. මහානාම
තනතුර : ලේකම්
දිනය :

A. S. M. S. Mahanama
Secretary
Ministry of Women and Child Affairs
and Social Security
5th Floor, (Stage II) Sethsiripaya
Battaramulla.

....
ගණන්දීමේ නිලධාරි
නම : චන්දිමා සිගේරා
තනතුර : කොමසාරිස්
දිනය : 2020.02.17

පී. චන්දිමා සිගේරා
කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
3 වන මහල, සෙත්සිරිපාය - II අදියර
බත්තරමුල්ල.

3

....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : ආර්.ඒ.ජේ. දිල්රුක්ෂි
දිනය : ගණකාධිකාරි
2020.02.27

ආර්. ඒ. ජේ. දිල්රුක්ෂි
ගණකාධිකාරි
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
03 වන මහල, සෙත්සිරිපාය II වන අදියර,
බත්තරමුල්ල.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2019 රු.	2018 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	218,469	64,792
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,501,160	1,071,541
අග්‍රිම ලැබීම්	73,610,000	77,939,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**75,329,629**	**79,075,333**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	54,219,758	52,295,444
සහනාධාර සහ මාරුකිරීම්	440,807	364,618
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	4,083,350	7,037,576
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**58,743,915**	**59,697,638**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**16,585,714**	**19,377,695**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	1,610,000
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	9,676,016	9,254,858
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**9,676,016**	**10,864,858**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	16,910,664	19,861,867
අත්තිකාරම් ගෙවීම්	9,391,081	8,997,057
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**26,301,745**	**28,858,924**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(16,625,729)	(17,994,066)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(40,015)	1,383,629
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	1,238,331	1,053,764
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	1,238,331	1,053,764
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	1,198,316	2,436,741
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	1,198,316	2,436,741
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	40,015	(1,382,977)
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	-	652
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	652

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

01. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

02. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

03. **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

04. **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

05. **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

06. **මුදල් හා මුදල් සමාන දෑ**

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	294,110	298,093	295,142	99%
ප්‍රාග්ධන	79,400	79,417	64,922	82%

3.6 මු.රෙ.208 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.8 – 1 දිස්ත්‍රික්ක

217-2-2-5-2202, 217-2-2-6-2202

රු. **,000**

අනු අංකය.	ප්‍රතිපාදන වෙන් කිරීම ලැබෙන්නේ කුමන අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තු වෙන්ද?	ප්‍රතිපාදන වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන		තථ්‍ය වියදම්	අවසාන ප්‍රතිපාදන ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			ආරම්භය	අවසානය		
1	කොළඹ	අවදානම් සහගත දරුවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සහ වෘත්තීය පුහුණුව සහ මූල්‍ය සහයන් ලබා දීම තුලින් සවිබල ගැන්වීම	2,438.365	2,438.365	2,431.915	99.74
2	ගම්පහ		1,808.200	1,808.200	1,808.200	100
3	කළුතර		2,292.415	2,292.415	2,276.660	99.31
4	ගාල්ල		2,877.099	2,877.099	2,866.973	99.65
5	මාතර		2,353.960	2,353.960	2,332.092	99.07
6	හම්බන්තොට		1,895.892	1,895.892	1,884.972	99.42
7	අනුරාධපුර		4,211.100	4,211.100	4,194.751	99.61
8	පොලොන්නරුව		1,022.900	1,022.900	1,008.047	98.55
9	කුරුණෑගල		4,686.284	4,686.284	4,651.532	99.26
10	පුත්තලම		1,762.585	1,762.585	1,693.163	96.06
11	මහනුවර		3,775.007	3,775.007	3,573.754	94.67
12	මාතලේ		1,371.400	1,371.400	1,296.620	94.55
13	නුවර එළිය		1,113.000	1,113.000	1,019.867	91.63
14	රත්නපුර		2,124.099	2,124.099	2,119.874	99.80
15	කෑගල්ල		1,778.548	1,778.548	1,775.748	99.84
16	මොනරාගල		1,614.200	1,614.200	1,577.765	97.74
17	බදුල්ල		2,105.880	2,105.880	2,059.811	97.81
18	යාපනය		1,716.100	1,716.100	1,700.912	99.11
19	වවුනියාව		785.600	785.600	477.459	60.78
20	මන්නාරම		485.900	485.900	485.785	99.98
21	මුලතිව්		537.800	537.800	531.239	98.78
22	කිලිනොච්චිය		480.000	480.000	471.361	98.20
23	අම්පාර		1,893.670	1,893.670	1,864.034	98.43
24	මඩකලපුව		2,162.449	2,162.449	2,077.233	96.06
25	ත්‍රිකුණාමලය		1,001.200	1,001.200	921.655	92.06
	එකතුව		**48,293.653**	**48,293.653**	**47,101.422**	**97.53**

217-2-2-4-2202 **රු. ,000**

අනු අංකය.	ප්‍රතිපාදන වෙන් කිරීම ලැබෙන්නේ කුමන අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තු වෙන්ද?	ප්‍රතිපාදන වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන		තථ්‍ය වියදම්	අවසාන ප්‍රතිපාදන ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			ආරම්භය	අවසානය		
1	වවුනියාව	හඳුනාගත් දරුවන් සමාජගත කිරීම	50.000	50.000	50.000	100
2	නුවරඑළිය		12.000	12.000	12.000	100
						100
	එකතුව		**62.000**	**62.000**	**62.000**	

3.8 -2 පළාත් සභා
217-2-2-3-2202, 217-2-2-4-2202, 217-2-2-5-2202

රු. ,000

අනු අංකය.	ප්‍රතිපාදන වෙන් කිරීම ලැබෙන්නේ කුමන අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන්ද?	ප්‍රතිපාදන වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන		ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			ආරම්භය	ආරම්භය		
1	මධ්‍යම	ළමා නිවාස ප්‍රතිසංස්කරණය කිරීම, අධීක්ෂණය සහ රැකබලාගන්නන් සඳහා පුහුණු වීම් පැවැත්වීම, හඳුනාගත් දරුවන් සමාජගත කිරීම, ආයතනගත දරුවන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම, දරුවන්ගේ ජීවන නිපුණතා ඔප් නැංවීම	1,493.866	1,493.866	1,493.866	100
2	ඌව		1,035.721	1,035.721	1,035.721	100
3	සබරගමුව		1,671.151	1,671.151	1,671.151	100
4	උතුරු මැද		342.246	342.246	342.246	100
5	නැගෙනහිර		500.000	500.000	500.000	100
	එකතුව		**5,042.984**	**5,042.984**	**5,042.984**	

3.8 -3 ජාතික - පළාත් කාර්ය මණ්ඩලය සහ පරත්ත ළමා ආරක්ෂණ මධ්‍යස්ථානය
217-2-2-3-2202, 217-2-2-4-2202, 217-2-2-5-2202

රු. ,000

අනු අංකය.	ප්‍රතිපාදන වෙන් කිරීම ලැබෙන්නේ කුමන අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන්ද?	ප්‍රතිපාදන වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම්	අවසාන ප්‍රතිපාදන ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			ආරම්භය	අවසානය		
1	සියලුම පළාත් වල පළාත් කාර්ය මණ්ඩලය	පුහුණු වැඩසටහන් සහ පලාත් රැස්වීම් පැවැත්වීම	2,881.275	2,881.275	2,881.275	100
2	පරත්ත ළමා ආරක්ෂණ මධ්‍යස්ථානය	ළමා නිවාස ප්‍රතිසංස්කරණය සහ අධීක්ෂණය කිරීම, ආයතනගත දරුවන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම, දරුවන්ගේ ජීවන නිපුණතා ඔප් නැංවීම	1,658.224	1,658.224	1,658.524	100
	එකතුව		**4,539.499**	**4,539.499**	**4,539.799**	

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2019/12/31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය	2019/12/31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	32,345,000	32,345,000		100%
9152	යන්ත්‍රෝපකරණ	9,964,944/95	9,964,944/95		100%
9153	ඉඩම්	2,655,000	2,655,000		100%
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.	VTY/C/PCCS/FA/2019/12	ඔබේ අංකය / உமது இல. / Your No.	
දිනය / திகதி / Date	2020 ජුනි 10 දින		

ගණන්දීමේ නිලධාරී ,

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු.64,605,215 ක් වූ අතර, එම ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ඒමේ දී රු.64,971,627 ක් ලෙස දක්වා තිබුණු අතර, රු.366,412 ක් වූ වෙනස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.6.1.2 අග්‍රිම ගිණුමේ ශේෂය

මැතිවරණ කොමිෂන් සභාවෙන් ප්‍රතිපූර්ණය කළයුතු අග්‍රිම ගිණුමේ රු.164,931ක් වූ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීමක් ලෙස හා ජංගම වත්කම් යටතේ මුදල් හා මුදල්වලට සමාන දෑ යටතේ දක්වා නොතිබුණි.

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ තැන්පතු ලැබීම්වල වටිනාකම රු.19,575 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාල රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891(1)	පවත්වා නොතිබුණි
(ආ)	බැරකම් පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 214	පවත්වා නොතිබුණි
(ඇ)	හානි පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 110	යාවත්කාලීන කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

වැය විෂයයක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා වැය විෂයයන් හතක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 සිට සියයට 37 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

2.1.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

භාණ්ඩාගාර ලේඛන අනුව වැය විෂයයන් 13ක ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා රු. 3,790,225ක බැරකම් වලට එළඹ තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

ඩබ්ලිව්.එම්.පී.ඒ. ෆොන්සේකා
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ඩබ්ලිව්.එම්.පී.ඒ. ෆොන්සේකා
සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වැය ශීර්ෂ අංකය	නිශ්චිත දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිදානය		
		100% - 90%	75% - 89%	50% - 74%
217 -2 -2 – 3 – 2202	ප්‍රතිසංස්කරණය කළ ළමා නිවාස සංඛ්‍යාව	√		
217 – 2 – 2- 4 – 2202	අධීක්ෂණය කළ ළමා නිවාස සංඛ්‍යාව	√		
	ආයතනගත දරුවන් රැකබලා ගන්නන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	√		
	සමාජගත කළ හඳුනාගත් දරුවන් සංඛ්‍යාව	√		
217 – 2 – 2- 5 - 2202	සංවර්ධනය සඳහා සකස් කළ ආරක්ෂණ සැලසුම් සංඛ්‍යාව	√		
	පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	√		
	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	√		
	පැවැත්වූ කමිටු සංඛ්‍යාව	√		
	ලබා දුන් අධ්‍යාපනික තාක්ෂණික මෙවලම් ප්‍රමාණය	√		
	විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය	√		
217-02-02-06-2202	ප්‍රතිලාභ ලැබූ දරුවන් සංඛ්‍යාව	√		
	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	√		
	පැවැත්වූ කමිටු සංඛ්‍යාව	√		

05
තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන	ඉලක්කය /අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0% - 49 %	50 % - 74 %	75% - 100
වෛද්‍ය ආධාර ලබාදීම	(3) නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම	(3-2) 2030 වනවිට වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ වළක්වාගත හැකි මරණ තුරන් කිරීම	(3.3.5) සෞඛ්‍යමය මැදිහත්වීමක් සඳහා සහාය ලබාදුන් ළමුන් සංඛ්‍යාව (* 3.3.5 න්)		** 53 %	
නිවුන් දරු ආධාර ලබාදීම	(2) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	(2 -1) 2030 වනවිට දරුවන් සහ අවදානම් තත්ත්වයන්ට ලක් වී ඇති පවුල් සඳහා ප්‍රමාණවත් පෝෂණයක් වසර පුරා ලබා ගැනීමට හැකිබව තහවුරු කිරීම	(2.1.1) පෝෂණ ඌණතාවයෙන් පෙළුණු ආධාර අවශ්‍ය ළමුන් සංඛ්‍යාව (* 2.1.1 අනුව)		** 64 %	
හදිසි විපත් ආධාර/ සෙනෙහස ආධාර/ ගංවතුර ආධාර වැඩසටහන්	(13) දේශගුණික විපර්යාශ හා ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මකවීම	(13 - ආ) අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ කුඩා දිවයින්වල පිහිටි සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන්,තරුණයින් සහ දේශිය හා ආන්තීකරණයට ලක් වූ ප්‍රජාවන්ද ඉලක්ක කර ගනිමින් කාලගුණික වෙනස්වීම් සඳහා ඵලදායි සැලසුම් සකස් කිරීමට හා කළමණාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩි දියුණු	(13.2.ඕ.1) අඩු ආදායම් ලාභී දරුවන් ඉලක්ක කර ගනිමින් ආපදා තත්ත්වයන් මත සිදුවන බලපෑම් අවම කරවීමට අවශ්‍යවන මූල්‍ය සහාය ලබාදෙන ළමුන් සංඛ්‍යාව			** 95%

		කිරීමේ යාන්ත්‍රණය ප්‍රවර්ධනය කිරීම				
අධ්‍යාපන ආධාර/ කැපකරු දෙගුරු ආධාර සෙවණ සරණ ආධාර වැඩසටහන්	(4)පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	(4-1) සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස්,සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ,ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම	(4.1.1) ස්ත්‍රී පුරුෂ භාවය අනුව සියළුම මට්ටම්වල ඉගනුම ලබන දරුවන් සහ යෞවනයන් අතර කියවීමට සහ ගණිතමය කුශලතාවයන් සඳහා වන අවම මට්ටම් සහිත අයගේ ප්‍රමාණය			** 94%
අවදානම් දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම	(1).සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම	(1.3.)පහල මට්ටමේ අයද ඇතුළත්ව සියළුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම,සහ 2030 වනවිට දරිද්‍රතාවයෙන් පෙලෙන සහ අවදානම් කණ්ඩායම් ප්‍රමාණවත්ලෙස එමගින් ආවරනයවී තිබීම	(1.3.1) සමාජ ආරක්ෂණ තල/ක්‍රම මගින් ආවරණය සැපයෙන ජනගහනයේ ස්ත්‍රී පුරුෂභාවය අනුව, ළමුන් රැකියා වියුක්ති පුද්ගලයන් වැඩිහිටියන් ආබාධිත පුද්ගලයන් ගර්භනී කාන්තාවන් ළදරුවන් රැකියා ආශ්‍රිත අනතුරු වලට ගොදුරු වූවන් සහ දරිද්‍ර මෙන්ම අවදානම් කණ්ඩායම් හි ප්‍රමාණය	** 32 %		
ළමා සමාජ/ ළමා සහා	(4) පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික	(4.7) 2030 වනවිට ඉගනුම ලබන සියළු දෙනා තිරසර	(4.3.1) ස්ත්‍රී පුරුෂභාවය අනුව පූර්ව			

වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුශලතාවයන් ලබාගෙන සිටීම.එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර සංවර්ධන රටාවන් මානව අයිතිවාසිකම්,සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම,ගෝලීය පුරවැසිභාවය හා සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායකවීම අදහස් වේ.	මාස 12 තුළ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගීත්වය අනුපාතය	** 6%		
පුහුණු හා කුහලතා සංවර්ධනය	(16) තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම,යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි,වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම	(16.6) සියළුම මට්ටම්වලදී ඵලදායි වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම	(16.6.1) ප්‍රධාන රාජ්‍ය වියදම් අංශයන් අනුව (නැතහොත් අයවැය කේතයන් හෝ සමාන) මූලික අනුමත අයවැයෙන් පංගුවක් ලෙස	** 2%		
ළමා කේන්ද්‍රීය ආපදා අවම කිරීමේ වැඩසටහන	(11) නගර හා ජනාවාස පරිපූර්ණ.ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	(11.ආ) 2020 වනවිට සියළුම ආකාරයේ සියළුම මට්ටම්වල ආපදා අවදානම්අවම කිරීම පිළිබඳ සෙන්ඩායි වැඩ සැළැස්මේ ප්‍රතිපත්ති සහ සැළසුම් ක්‍රියාවට නංවන,සියළු දෙනා අන්තර්ගත වූ සම්පත් කාර්යක්ෂමතාවයෙන් භාවිතකරන,කාලගුණික වෙනස්කම් අවම කිරීමේ සහ ඒ අනුව	(11.ආ.1) 2015 -2030 ආපදා අවදානම අවම කිරීම සඳහා වන සෙන්ඩායි කාර්ය රාමුවට අනුකූලව ජාතික අවදානම් අවම කිරීමේ ක්‍රමෝපාය න් ක්‍රියාත්මක	** 48 %		

		හැඩගැසෙන,ආපදාව න්ට ඔරොත්තු දෙන ආකාරයේ නගර සහ මානව ජනාවාසවල ප්‍රමාණය සැලකිය යුතු මට්ටමෙන් ඉහළ නැංවීම	කරන රටවල් සංඛ්‍යාව			
	(16) තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම,යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි,වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම	(16.3)සියළුම දෙනාටම නීතියේ සාධාරණත්වය ලබා ගැනීම හැකිවීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරී	(16.3.1.) දරුවන්ට වෙනස් කොට සැළකීම වැළැක්වීම සඳහා සමාජගත කරන ලද ළමයින් සංඛ්‍යාව/ වැඩි දියුණු කරන ලද ළමා නිවාස සංඛ්‍යාව (*)			** 116 %

*දර්ශක අදාළ වන පරිදි සංශෝධනය කර ඇත.
**දර්ශක දෙපාර්තමේන්තුවට ලැබෙන අදාළ ඉල්ලීම් පදනම් කර සකස් කර ඇත.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අභියෝග:

1. දෙපාර්තමේන්තුවට අයත් සමස්ත මානව සම්පත මේ සම්බන්ධයෙන් නිශ්චිත පුහුණු වැඩසටහනක් ලබාදීමට නොහැකිවීම
2. ජයග්‍රහණ දර්ශක සකස් කිරීමේදී දෙපාර්තමේන්තු මුලික තොරතුරු මත පමණක් පදනම්වීමට සිදුවීම
3. දෙපාර්තමේන්තු කාර්යභාරයන් සමග සෘජුවම ඉලක්ක ගැලපීමේ ඇති දුෂ්කරතාවය

ජයග්‍රහණ:

1. දෙපාර්තමේන්තු පුහුණු සංචිත නිලධාරීන් සඳහා දින 02 මුලික පුහුණු වැඩසටහන් 02ක් පැවැත්වීම
2. ළමා සමාජ/ළමා සභා දරුවන් සඳහා මේ සම්බන්ධ දැනුම ලබාදීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම
3. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් තිරසර සංවර්ධන අරමුණු සමඟ ඉලක්ක ගත කිරීම

06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	අබෑර්තු/අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	7	5	2
තෘතීයික	236	232	4
ද්විතියික	231	201	30
ප්‍රාථමික	17	14	3

6.2 ආයතනයේ කාර්යය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපානු ලැබ ඇති ආකාරය

අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාවට අනුව ළමා හිමිකම් ප්‍ර වර්ධන සහකාර නිලධාරීන් 25ක් පමණ හිඟයක් පවතී. පුරප්පාඩු පිටවීමේ නොහැකියාව නිසා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සේවාව දීමට අපහසු වී ඇත. තවද නීති නිලධාරී තනතුර හා පරිවාස නිලධාරී තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අදාල කටයුතු සිදු කෙරෙමින් පවතී. නීති නිලධාරී පුරප්පාඩුව තවමත් පවතින බැවින් දෙපාර්තමේන්තුවට ලැබෙන නීතිමය ගැටලු වලදී භාහිර නීති නිලධාරීන්ගේ සහය ලබා ගැනීමට සිදුවී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
කාර්යාල උපකරණ පිලිබඳ පාලනය	1	දින 02	රු.8500.00		දේශීය	විෂය අනුව රාජකාරි සාර්ථකව ඉටු කිරීම
ගිණුම් පොත් ක්‍රමානුකූලව නඩත්තු කිරීම	1	දින 02	රු.8500.00		දේශීය	විෂය අනුව රාජකාරි සාර්ථකව ඉටු කිරීම
කාර්යාල කාර්ය සහයකයින්ගේ හා රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය	1	දින 01	රු.3000.00		දේශීය	රාජකාරි වගකීම හා ස්වභාවය හඳුනා ගැනීම
රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් B ගිණුම පිළියෙළ කිරීම	1	දින 01	රු.5000.00		දේශීය	විෂය අනුව රාජකාරි සාර්ථකව ඉටු කිරීම
පොත් බැඳුම්කරණ පාඨමාලාව	1	මාස 10	රු.20000.00		දේශීය	සියලු පොත් බැඳුම්කරණ කටයුතු හා පලුදු වූ ලිපි ගොනු සැකසීම

රියදුරන්ගේ කුසලතා සංවර්ධනය	1	දින 01	රු .6000.00		දේශීය	රාජකාරි වගකීම හා ස්වභාවය හඳුනා ගැනීම
කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	1	දින 02	රු .6000.00		දේශීය	විෂය අනුව රාජකාරි සාර්ථකව ඉටු කිරීම
ප්‍රසම්පාදන ක්‍රියාවලිය	1	දින 02	රු .6000.00		දේශීය	විෂය අනුව රාජකාරි සාර්ථකව ඉටු කිරීම
රජයේ වාහන නඩත්තුව	1	දින 01	රු.3000.00		දේශීය	විෂය අනුව රාජකාරි සාර්ථකව ඉටු කිරීම
සමාජ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව (30% ප්‍රතිපාදන)	01	වර්ෂ 01	රු.12000.00		දේශීය	ළමා පුහුණු මධ්‍යස්ථානයේ රාජකාරි සාර්ථකව ඉටු කිරීම
දර්ශන විශාරද උපාධිය (තෙවන වසර+ විභාග ගාස්තු)	01	වර්ෂ 03	රු.45500.00		දේශීය	දිස්ත්‍රික්කය තුළ ළමා ගැටළු හඳුනා ගැනීම හා විසඳුම් ලබා දීම
උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	04	වර්ෂ 01	රු.142800.00		දේශීය	ක්ෂේත්‍ර රාජකාරි සහ උපදේශන කටයුතු සඳහා
ළමා නිවාස කාර්යමණ්ඩල සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන	32	දින 04	රු.131820.00		දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම
ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/සහකාර නිලධාරී සම්පත්දායක සංචිත පුහුණු වැඩසටහන (කණ්ඩායම)	30	දින 04	රු.409995.00		දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම
ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/සහකාර නිලධාරී ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන	20	දින 03	රු.88470.00		දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම
ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන	13	දින 05	රු.65671.00		දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම
නවක සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන	15	දින 05	රු.85700.00		දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම
ළමා නිවාස කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා වූ උසස් පුහුණු හා සහතිකපත්‍ර පාඨමාලා (කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ	80	මාස 04	රු.2600000.00		දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම

මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය සමග ඒකාබද්ධව)						
සිද්ධි කළමනාකරණ පුහුණු වැඩසටහන	332	දින 02	රු.2,079,000.00		දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම
තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ පුහුණු වැඩසටහන	85	දින 02	රු.540,000.00		දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම
ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවමකරණ වැඩසටහන (Child Centric Disaster Risk Reduction)	689 (නිලධාරීන් සහ ළමා සමාජ/ ළමා සහා සාමාජික දරුවන් සඳහා)	2019 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා	රු.450,000.00	-	දේශීය	ආපදා අවස්ථාවන්හී දරුවන්ගේ ජීවත්වීමේ සහ ආරක්ෂාවීමේ අයිතිය තහවුරු කිරීමට පුහුණු දැනුම භාවිත කිරීම
ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය (Symposium on Child Rights)	450	2019 අගෝස්තු	රු.550,000.00	37	දේශීය	ශ්‍රී ලංකාවේ ළමයින් සම්බන්ධයෙන් පවත්නා තත්ත්කාලීන ගැටළු පිළිපද ක්ෂේත්‍රයේ නියුතු සෙසු ආයතන විසින් සිදුකරණ ලද පර්යේෂණ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමත් ඔවුනගේ අත්දරකීම් අනුසාරයෙන් එම ගැටළු සඳහා විසඳුම් අධ්‍යනය කොට දරුවන්ගේ උපරිම ආරක්ෂාව, රැකවරණය සහ සමස්ථ අයිතීන් සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් වන උපායමාර්ග හදුනා ගැනීම

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය

ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූලව ළමා අයිතිවාසිකම් භුක්ති විඳීමට දරුවන්ට අවස්ථාව සැලසීම දැක්ම කරගත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, ආකල්ප, කුසලතා යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය කාර්යයකි. ඊට හේතුව සමාජයේ සිදුවන වෙනස්වීම් හමුවේ අභියෝගයට මුහුණ දෙන ප්‍රධාන සමාජ කාණ්ඩය වන්නේ ළමුන්ය. එම අභියෝගයන් හඳුනාගෙන ඒවාට සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය සහය ලබා දීමට යාවත්කාලීන වූ වෘත්තීය දැනුමකින් යුත් නිලධාරීන් පිරිසක් සිටීම අත්‍යවශ්‍ය වූ කාර්යයකි. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාරවරුන් සඳහා කාලීනව සිදුවන සමාජ වෙනස්වීම් හමුවේ ළමුන් ආමන්ත්‍රණය කළ යුතු ක්ෂේත්‍රයක් පිළිබඳ විධිමත් දැනුමක් ලබා දී වඩා කාර්යක්ෂම, ඵලදායී සේවාවක් ලබා දීමට අපේක්ෂා කෙරේ.

එමෙන්ම දෙපාර්තමේන්තුවේ සේවයේ නියැලෙන සෙසු නිලධාරීන් වන කළමනාකරණ සහකාර, කාර්යාල කාර්යය සේවක නිලධාරීන් සඳහා ද පුහුණුවීම් සිදු කරනුයේ කාර්යාලයීය කටයුතුවල ඵලදායීතාව වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙනි.

07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලතා නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන් නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	වාණිජ ව්‍යාපාරයක් නොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	වාණිජ ව්‍යාපාරයක් නොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	මෙම වසරේ සිට පවත්වාගෙන යාමට කටයුතු යොදා ඇත	
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	ලේඛනගත කොට යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු යොදා ඇත	
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20)යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මූලය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			

5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමුටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව,වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොඅලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර්	අනුකූල වේ		

	ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක් දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්දන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂය අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			

15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල නොවේ	ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් නොවේ	
15.2	රැස් කර තිබූ ආදායම්,තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් නොවේ	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබ දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 () දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	2020 වසර සඳහා සකස් කර ඇත	

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම	අනුකූල නොවේ	2020 වසර සඳහා සකස් කර ඇත	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	2020 වසර සඳහා සකස් කර ඇත	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	2020 වසර සඳහා සකස් කර ඇත	
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	2020 වසර සඳහා සකස් කර ඇත	
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ	2020 වසර සඳහා සකස් කර ඇත	
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසිම් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		